පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO — 760 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 05/05/2024 පැය 1420

# මාධ්‍ය නිවේදනය

## 01 . අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය

2024.05.04 වන දින සවස් කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ ඕරුගොඩවත්ත ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 44 මිලිග්‍රෑම් 630 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් ඕරුගොඩවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - මිරිහාන පොලිස් වසම.

2024.05.05 වන දින අළුයම් කාලයේදී මිරිහාන පොලිස් වසමේ නව රෝහල මාර්ගයේ කිඹුලාවල ප්‍රදේශයේදී කිඹුලාවල දෙස සිට නව රෝහල දෙසට ධාවනය වූ යතුරු පැදියක් ඊට ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි යතුරු පැදියක මුහුණට මුහුණ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ එක් තුවාලකරුවෙකු ජයවර්ධනපුර රෝහලට සහ අනෙක් තුවාලකරු කළුබෝවිල රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව දෙදෙනාම මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 18 හා 20 වයසේ පසු වූ මිරිහාන හා මාදිවෙල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර ජයවර්ධනපුර රෝහලේ සහ කළුබෝවිල රෝහලේ මෘත ශරීරාගාර වල තැන්පත් කර ඇති අතර අනතුරට හේතුව පැදිකරුවන්ගේ නොසැලකිලිමත් හා අපරික්ෂාකාරි ලෙස රිය පැදවීම බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මිරිහාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**